දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක:- 02/2011

මගේ අංකය: සිඩී/03/01
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
08 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
2011 මැයි 24 දිනදීය.

අදාල සියලුම නිලධාරීන් වෙත,

## ආධාර අවශ්‍ය වන කලාකරුවන්ට ආධාර ගෙවීමේදී පිළිපැදිය යුතු උපදෙස් හා නියමිත මුදල් ප්‍රමාණයන්

### 1.අගහිඟ කලාකරු ආධාර ගෙවීම

(අ) පහත සඳහන් සුදුසුකම් ඇති කලාකරුවන් අගහිඟ කලාකරුවන් ලෙස සලකා වර්ෂයකට එක් වතාවක් පමණක් රු.3000/- ක ආධාර මුදලක් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

I. ඉල්ලුම් කරන කලාකරු වර්ෂයකට රු.60000/- ට අඩු ආදායම්ලාභියෙකු වීම
II. රජයේ විශ්‍රාම වැටුපක් නොලබන අයකු වීම
III. වර්ෂ ගණනාවක් කලා ක්ෂේත්‍රයේ නියුතුව සිටි අයකුවීම
IV. කලාකරුවාණන්ගේ/කලාකාරිනියගේ කලත්‍රයා ද අඩු ආදායම්ලාභියෙකු වීම
V. ඉල්ලුම් කරන දිනට වයස අවුරුදු 60 ට වැඩිවීම (ආබාධිත කලාකරුවන් සඳහා වයස් ප්‍රමාණය බල නොපානු ඇත)

(ආ) අගහිඟ කලාකරු ආධාර ගෙවීමේදී පහත සඳහන් කරුණු පිළිපැදිය යුතු වේ.

I. කලාකරුවා පදිංචි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඉල්ලුම්පත් ඉදිරිපත් කළයුතු අතර, සෑම වර්ෂයක් පාසාම ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. කලාකරුවන් පිළිබඳ තොරතුරු කැඳවීමට අවශ්‍ය යයි හැඟෙන අවස්ථාවලදී දෙපාර්තමේන්තුව මගින් ඔවුන්ගේ තොරතුරු අදාළ සංස්කෘතික නිලධාරි මගින් කැඳවනු ඇත.
II. කිසියම් අවස්ථාවකදී ආධාරලාභියා මියගියහොත් එම කොට්ඨාසය භාර සංස්කෘතික නිලධාරි/සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරි විසින් ඒ බැව් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයන් සහිතව සංස්කෘතික අධ්‍යක්ෂ වෙත දන්වා එවිය යුතුය.
III. එසේ කලාකරු මියයන අවස්ථාව වනවිට ඔහුට එම වර්ෂය සඳහා හිමි ආධාර මුදල ප්‍රාදේශීය ලේකම් වෙත යවා තිබුණහොත් ඔහුගේ තෙමස් පූර්ණ හෝ වර්ෂ පූර්ණ දානමය පිංකම සඳහා පවුලේ ඥාතියෙකුට එම මුදල ලබාදිය යුතුය. (මෙහිදී ඥාතිවරයාගේ අනන්‍යතාවය හඳුනාගෙන ආධාර මුදල ගෙවිය යුතු අතර මියගිය බව සනාථ කිරීම සඳහා මරණ සහතිකයේ පිටපතක් ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව එවීමට කටයුතු කළ යුතුය.)
IV. මියගිය ආධාරලාභියා වෙනුවට එම කොට්ඨාසයේම ඉහත 1 (අ) හි සඳහන් සුදුසුකම් සපුරා ඇති වෙනත් කලාකරුවකු මෙම ආධාර ක්‍රමයට දායක කර ගැනීමට සංස්කෘතික නිලධාරි/සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරි හට කටයුතු කළ හැකිය.

### 2. පෙරහැර ආධාර ගෙවීම

මෙම පෙරහැර ඓතිහාසික වැදගත්කමක් ඇති පෙරහැරක් විය යුතුය. අදාල කොට්ඨාසය භාර සංස්කෘතික නිලධාරි මෙම පෙරහැර පිළිබඳව දැනුවත් විය යුතු අතර, ආධාර මුදල් ඉල්ලීමේදී ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය. එමෙන්ම පෙරහැර පහත සඳහන් කුමන වර්ගයේ පෙරහැරක්ද යන්න ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් විසින් සඳහන් කළ යුතුය. ඒ අනුව නියමිත ආධාර මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

I. ප්‍රාදේශීය මට්ටමේ පෙරහැර සඳහා - රු. 5000/-
II. දිස්ත්‍රික් මට්ටමේ පෙරහැර සඳහා - රු. 10000/-
III. ජාතික මට්ටමේ පෙරහැර සඳහා - රු. 15000/- - 25000/- අතර

- ආධාර මුදල් ලබාදීමෙන් පසු ඒ පිළිබඳව පසු විපරම් කිරීම අදාළ සංස්කෘතික නිලධාරිවරයාගේ වගකීම වේ.

## 3. අවමංගල්‍යාධාර

කලාකරුවන් මියගිය අවස්ථාවලදී පහත සඳහන් අයුරින් ආධාර ගෙවීමට කටයුතු කළ හැකිය.

1. ප්‍රවීණයන්
2. කලාභූෂණලාභීන්
3. අනෙකුත් කලාකරුවන්

I. ප්‍රවීණයන්

- අඛණ්ඩව කලා ක්ෂේත්‍රයේ අවුරුදු 20 ක්වත් රැඳී සිටිය යුතුය
- ප්‍රවීණයකු ලෙස ප්‍රචලිත වූ ආකාරය
- රජයේ කුමන හෝ ඇගයීමකට පාත්‍ර වූයේද යන්න දැක්විය යුතුය (කුසලතා සහතික, ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීම)

ඉහත පරිදි ප්‍රවීණයන් කවුරුන්ද යන්න සංස්කෘතික නිලධාරි/සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරි සනාථ කරගත යුතුය.

II. කලාභූෂණලාභීන්

සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් කලාභූෂණ සම්මානයෙන් උපහාර පිදූ කලාකරුවන්

III. අනෙකුත්

පිළිගත් කලාකරුවකු බවට ප්‍රාදේශීය ලේකම් සහතික කර එවිය යුතුය.

ආධාර ගෙවීමේදී පහත සඳහන් පරිදි ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.

i ජාතික මට්ටමින් ප්‍රචලිත කලාකරුවන් සඳහා -රු.15000/ සිට රු.25,000/- දක්වා
ii දිස්ත්‍රික් මට්ටමින් ප්‍රචලිත කලාකරුවන් සඳහා -රු. 10,000/-
iii ප්‍රාදේශීය මට්ටමින් ප්‍රචලිත කලාකරුවන් සඳහා - රු. 5,000/-

## 4. වෛද්‍යාධාර

වෛද්‍යාධාර සඳහා ඉල්ලුම් කිරීමේදී ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිතව වෛද්‍ය වාර්තා සමග ඉදිරිපත් කළ යුතුය. (මෙම රෝගී අවස්ථාවන්හිදී එක් වතාවක් පමණක් ආධාර ගෙවීම් සිදු කෙරේ. එහෙත් විශේෂිත අවස්ථා පැන නැගුනහොත් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය යටතේ නැවත ගෙවීම් කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.)

I. විශේෂිත රෝග සඳහා (පිළිකා, වකුගඩු, ක්ෂයරෝග වැනි නිදන්ගත රෝග සඳහා) - රු. 5000/-
II. සාමාන්‍ය රෝග සඳහා - රු. 3000/-
III. ශල්‍ය කර්මයන් සඳහා - රු. 5000/-

## 5. විවිධ උත්සව ආධාර

I. දේශීය සම්ප්‍රදායික සංස්කෘතිකාංග ඇතුලත් උත්සවයක් බවට ප්‍රාදේශීය ලේකම්/සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ/සංස්කෘතික නිලධාරි/සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරි සෑහීමකට පත්විය යුතුය.
II. විශේෂ ගුණ සමරු උත්සවවලදී එයට භාජනය වන තැනැත්තා කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණ විශේෂිත පුද්ගලයකු විය යුතුය. (ජාතික මට්ටමෙන් පිළිගත් කලාකරුවන්, සංස්කෘතිකමය වටිනාකමක් ඇති ක්ෂේත්‍රවල නියැලුණු ප්‍රවීණයන්)

ආධාර මුදල:-

| | | |
|---|---|---|
| I. | විශේෂ ගුණ සමරු උත්සව සඳහා | රු. 10000/- |
| II. | දේශීය සම්ප්‍රදායික සංස්කෘතිකාංග (දහඅට සන්නිය, සත්පත්තිනි, කොහොඹා කංකාරිය, ගම්මඩු, වැදි නැටුම් ආදී) ඇතුළත් උත්සව සඳහා | රු. 10000/- |
| III. | සංස්කෘතික හා කලා කටයුතු වටිනාකමකින් යුත් සංස්කෘතිකාංග ඇතුළත් උත්සව සඳහා | රු. 5000/- |

6. කලායතන ආධාර

I. සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ කලායතනයක ලියාපදිංචි කළ දින පටන් වසරක් ගතවන තුරු එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ සමීක්ෂණය කර මුල්ම ආධාර මුදල ගෙවීම කළ යුතුය.
II. ආධාර ගෙවීමේදී වසරක් පාසා කලායතනයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සංස්කෘතික නිලධාරී/සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරී විසින් කලායතනය පරීක්ෂා කර දෙපාර්තමේන්තුව මගින් සපයා ඇති සමීක්ෂණ වාර්තාව සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සමග දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.
III. සමීක්ෂණ වාර්තා එවීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු ලේඛන සමග සසඳා බලා විස්තර නිවැරදිව ඉදිරිපත් කර ඇත්තේ නම් හා ප්‍රාදේශීය ලේකම් නිර්දේශ කර ඇත්තේ නම් අදාල ආධාර මුදල ගෙවීමට කටයුතු කළ යුතුය.
IV. කලායතන අධීක්ෂණය සඳහා සංස්කෘතික නිලධාරී/සංස්කෘතික සංවර්ධන සහකාර නිලධාරී ගිය බවටත් අදාල ආධාර මුදල් නිර්දේශ කළ බවටත් කලායතනයේ ලොග් සටහන් පොතෙහි සටහන් තැබිය යුතුය.
V. ශ්‍රේණිගත කලායතනවල ප්‍රගතිය සෑම වර්ෂ තුනකට වරක් පරීක්ෂා කළයුතු අතර මෙහිදී ලබා ගන්නා ලකුණු අනුව ආධාර මුදල කොපමණද යන්න තීරණය කළ යුතුය.
VI. එමෙන්ම වර්ෂයක් තුළ කලායතනයක් ලැබිය යුතු අවම ලකුණු උපයාගත නොහැකි වුවහොත් එම කලායතනයට ආධාර ලබා ගැනීමේ හිමිකම අහිමි වේ.

පහත සඳහන් පරිදි කලායතන සඳහා ආධාර මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.

| | | |
|---|---|---|
| I. | විශිෂ්ඨ අසිශ්‍රේණිගත කලායතන සඳහා | රු. 5000/- |
| II. | විශිෂ්ඨ ශ්‍රේණිගත කලායතන සඳහා | රු. 4000/- |
| III. | සාමාන්‍ය ශ්‍රේණිගත කලායතන සඳහා | රු. 3500/- |
| IV. | නව කලායතන සඳහා (ලියාපදිංචි කර වසරක් ගතවූ කලායතන ) | රු. 1500/- |

ඉහත සඳහන් පෙරහැර, අවමංගල්‍ය, වෛද්‍ය හා විවිධ උත්සව ආධාර මුදල් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය පරිදි වෙනස් වීමට ඉඩ ඇත.

කිසියම් අවස්ථාවකදී මෙම ආධාර මුදල් අදාල ආධාරලාභීන් වෙත ගෙවීමට නොහැකි වුවහොත් ඊට හේතු දක්වා ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර සංස්කෘතික අධ්‍යක්ෂ නමට ලියූ වෙක්පතකින් ආපසු එවිය යුතුය.

විජිත් කණුගල
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ

පිටපත:- ලේකම්, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය